# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1985/6 - 2016 සැප්තැම්බර් මස 19 වැනි සඳුදා - 2016.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට වැලිවිට ජල සම්පාදන ක්‍රමය යටතේ ජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 05 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1175.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 475-A, මහදෙනිය ග්‍රාම නිලධාරී වසමේ වැලිවිට ගමේ පිහිටි කුරුඳුවත්ත නමැති සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 13 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | |
|---|---|
| *උතුරට* | ඃ වැව පාර ; |
| *නැගෙනහිරට* | ඃ වැව පාර සහ රජඋයන ; |
| *දකුණට* | ඃ පළමු පටුමග හා රජ උයනේ කොටසක් ; |
| *බටහිරට* | ඃ වැව පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* ඃ ප්‍රේමසිරි සෙනෙවිරත්න මයා,<br>
හුණුපොළ පාර,<br>
අත්තනගල්ල.

10 - 24

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ තැන්නේකුඹුර සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 05 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1233.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 275, තැන්නේකුඹුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තැන්නේකුඹුර ගමේ පිහිටි ''තැන්නේකුඹුර වත්ත'' නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 35 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස ඃ

| | |
|---|---|
| ඉඩමේ නම | ඃ තැන්නේකුඹුර වත්ත |
| ප්‍රමාණය | ඃ පර්චස් 35 |

මායිම්

| | |
|---|---|
| උතුරට | ඃ අංක 0178 A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 (අභ්‍යන්තර මාර්ගය) හා ඒ. එම්. විජිත බණ්ඩාර මහතා හිමිකම් කියන ඉඩම ; |
| නැගෙනහිරට | ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස හා අංක 0178 A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 (අභ්‍යන්තර මාර්ගය) ; |
| දකුණට | ඃ මෙම ඉඩමේ ඉතිරි කොටස හා අංක 0178 A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 (අභ්‍යන්තර මාර්ගය) ; |
| බටහිරට | ඃ ඒ. එම්. විජිත බණ්ඩාර මහතා හා තවත් අය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* ඃ 01. ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් පුද්ගලික සමාගම.
අංක 155 A,
ඩී. එස්. සේනානායක වීදිය,
මහනුවර.

10 - 25

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ තැන්නේකුඹුර සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටස් වල පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල පරවශතා අයිතිය අත්කර ගැනිම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 05 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1232.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 269, අම්පිටිය - උඩගම උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, සෙමනේරිය වත්ත ගමේ පිහිටි ''සෙමනේරිය වත්ත'' සහ අංක 275, තැන්නේකුඹුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තැන්නේකුඹුර ගමේ පිහිටි, ''තැන්නේකුඹුර වත්ත'' නැමති ඉඩම් වලින් මුළු ප්‍රමාණයෙන් පර්චස් 12.2 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක :

කැබලි අංක 1A

ඉඩම පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසය : අංක 269, අම්පිටිය - උඩගම උතුර
ගම : සෙමනේරිය වත්ත
ඉඩමේ නම : සෙමනේරිය වත්ත
ඉඩමේ ප්‍රමාණය : පර්චස් 4.6

මායිම්

උතුරට : ඩී. එම්. ජයතිලක මහතා හිමිකම් කියන ඉඩම හා අම්පිටිය ගලපිට කුඹුර හරහා තැන්නේකුඹුර දක්වා දිවෙන මාර්ගය ;
නැගෙනහිරට : ඩී. එම්. ජයතිලක මහතා හිමිකම් කියන ඉඩම හා අංක 0178A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 ;
දකුණට : ඒ. එම්. විජිත බණ්ඩාර මහතා හිමිකම් කියන ඉඩම ;
බටහිරට : අම්පිටිය ගලපිට කුඹුර හරහා තැන්නේකුඹුර දක්වා දිවෙන මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :*

01. ඒ. එම්. විජිත බණ්ඩාර මහතා,
අංක 424, මී කනුව පාර,
ගලපිට කුඹුර,
අම්පිටිය.

02. ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවෙට් ලිමිටඩ්,
අංක 155A,
ඩී. එස්. සේනානායක වීදිය,
මහනුවර.
හා

03. තවත් අය

කැබලි අංක 1B

ග්‍රාම නිලධාරි කොට්ඨාසය : අංක 275, තැන්නේකුඹුර
ගම : තැන්නේකුඹුර
ඉඩමේ නම : තැන්නේකුඹුර වත්ත
ඉඩමේ ප්‍රමාණය : පර්චස් 7.6

මායිම්

උතුරට : අංක 0178A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 2 ;
නැගෙනහිරට : අංක 0178A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 හා කැබලි අංක 2 ;
දකුණට : අංක 0178A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 3 ;
බටහිරට : ඒ. එම්. විජිත බණ්ඩාර මහතා හිමිකම් කියන ඉඩම හා අංක 0178A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 3.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*
ක්‍රෙඩිට්ලයින් ෆයිනෑන්ෂල් සර්විසස් ප්‍රයිවෙට් ලිමිටඩ්,
අංක 155A,
ඩී. එස්. සේනානායක වීදිය,
මහනුවර.

10 - 26

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.